

# අ.පො.ස. උසස් පෙළ

## සාමාන්‍ය තොරතුරු තාක්ෂණය

# A/L - GIT


අනෝමා දොලේවත්ත

මාවනැල්ල කලාප පරිගණක සම්පත් මධ්‍යස්ථානය

☎ 035 2241114, 071 9422230

# නිපුණතා මට්ටම 4.2

සරල ගණිත ගැටළු විසඳීම සඳහා පැතුරුම්පත් මෘදුකාංග භාවිත කරයි.

## කොටස -5

GIT

# පෙර දැනුම

- ද්විමාන තලයක සිරස් තීරු (Columns) හා තිරස් පේළි (Rows) වශයෙන් පිහිටි කෝෂ සමූහයකින් වැඩපත (Worksheet) නිර්මාණය වී ඇත.
- වැඩපතක ඇති තීරු නම් කර ඇත්තේ ඉංග්‍රීසි කැපිටල් අක්ෂර හෝ අක්ෂර සංයෝජන හෝ මගිනි.
- වැඩපතක ඇති පේළි නම් කර ඇත්තේ අංක මගිනි.
- පළමු ව තීරුවේ අක්ෂරයත් දෙවනු ව පේළියේ අංකයත් යොදා කෝෂ නම් කරනු ලැබේ. එය කෝෂ ලිපිනය (Cell Adress) ලෙස හැඳින්වේ.
- කෝෂයක අන්තර්ගතය ලේබල් (Label), අගයන් (Value) හෝ සූත්‍ර (Fomulae) වලින් එකකි.
- සූත්‍රයක් සමාන (=) ලකුණින් ආරම්භ කරනු ලැබේ.
- මෙහෙයවන (Operator) සඳහා ප්‍රමුඛතා අනුපිළිවෙළක් පවතී.
- සූත්‍ර ලිවීම සඳහා කෝෂ ලිපින, මෙහෙයවන සහ ශ්‍රිත (Function) භාවිත කෙරේ.
- ලේබල සහ අගයන් හැඩසවි (Formatting) කිරීමට හැඩසවි මෙවලම් භාවිත කෙරේ.
- සූත්‍රයක් පහසුවෙන් පිටපත් කිරීමට පිරවුම් හැඬලය (Fill handle) භාවිත කෙරේ.
- සාපේක්ෂ කෝෂ යොමුවක් (Relative cell reference) නිරපේක්ෂ (Absolute) කිරීම සඳහා ඩොලර් සංකේතය ($) භාවිත කෙරේ.
- දත්ත සංඛ්‍යාත්මක නිරූපණයට වඩා ප්‍රස්තාර මගින් නිරූපණය, සැසඳීම හා තේරුම් ගැනීම පහසු කෙරේ.

# ඉගෙනුම් ඵල

- තොරතුරු විමසීම සඳහා පෙරීමේ මෙවලම භාවිත කරයි
- දත්ත අනුක්‍රමයකට සංවිධානය කිරීම සඳහා තේරීමේ මෙවලම භාවිත කරයි
- අවශ්‍ය පරිදි පිටුසැලසුම් කරයි
- වැඩපත පූර්ව දර්ශනය කොට මුද්‍රණය කරයි

- දත්ත පෙරා ගැනීම Filter
- දත්ත තේරීම Sort

**පැතුරුම් පත් මෘදුකාංග හරහා දත්ත තේරීම සහ පෙරීම**

**දත්ත තේරීම**

පැතුරුම් පත් මෘදුකාංග හරහා අවශ්‍ය පරිදි දත්ත, පේලියක් හෝ පේලි කිහිපයක් හෝ අනුව, ආරෝහණ/ අවරෝහණ පරිපාටියට අනුව හෝ ඔබට අවශ්‍ය වෙනත් නිර්ණායක අනුව හෝ තෝරා ගැනීමේ පහසුකම ඇත.

**දත්ත පෙරීම**

පැතුරුම් පත් මෘදුකාංග හරහා දත්ත අවශ්‍ය පරිදි පෙරා ලබා ගත හැකි ය. දෙන ලද නිර්ණායකයනට අනුව අවශ්‍ය දත්ත උපකුලකයක් වෙන්කොට ලබා ගත හැකි ය.

**Page Layout - පිටුසැලසුම**

**Print Preview - මුද්‍රණ පූර්ව දර්ශනය**

**Print - මුද්‍රණය**

**වැඩපතක් මුද්‍රණය කිරීම**

සම්පූර්ණ වැඩපත හෝ ඉන් අවශ්‍ය කොටසක් හෝ මුද්‍රණය කර ගැනීමේ පහසුකම පැතුරුම්පත් මෘදුකාංග තුළ දක්නට ඇත.මුද්‍රණයට පෙර පහත දැක්වෙන වෙනස්කම් සිදු කොට පැතුරුම් පත සකස්කොට ගත හැකි ය.

- පිටු විකල්ප(දිශානතිය, ප්‍රමාණය ඇදිය)
- පිටු දාර, සහ එකෙල්ල කිරීම ආදිය
- පැතුරුම් පත් විකල්ප(මුද්‍රණ පෙදෙස, කොටු රේඛා (grid lines), පුනර්කරණය විය යුතු පේළි/තීරු ආදිය

# සාරාංශය

Filter පෙරීම

Sort තේරීම

Page Layout පිටුසැලසුම

Print Preview මුද්‍රණ පූර්ව දර්ශනය

Print මුද්‍රණය

GIT

# Thank You

Anoma Dolewatta
Zonal CRC – Mawanella
☎ 035 2246110